ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ (ACA–F) මූලධන වත්කම් අත්පත් කරගැනීමේ වියදම රු.223,152,569 ක් වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ACA–6) එය රු.220,331,542 ක් ලෙස දැක්වීම හේතුවෙන් වත්කම් අත්පත් කරගැනීම් (Purchases) රු.2,821,027 ක් අඩුවෙන් දක්වා තිබුණි.	විගණනයෙන් පෙන්වාදෙන වෙනස ඇති වී තිබෙන්නේ 187-2-4-9-2105 ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් යටතේ මාන්කුලම්, කන්කසන්තුරේ හා පරන්තන් යන ආයෝජන කලාප ස්ථාපිත කිරීම සඳහා පිළිවෙලින් මුලතිව්, යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරු වෙත ප්‍රතිපාදන ලබාදීම හේතුවෙනි. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට අදාළ නොවන වත්කම් බැවින් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හෝ ප්‍රාදේශීය කාර්යාල විසින් මෙම වත්කම් ඇතුළත් කර ගත යුතුය.	මූලධන වියදම් අත්පත් කර ගැනීමේ වියදමට අදාළ වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් විය යුතුය.

(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශය ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙන් ඉවත් කර තිබුණද රු.21,293,616 ක් වූ ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ කුලී අත්තිකාරම් මුදල නිරවුල් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වැඩ හා අත්තිකාරම් (ACA-5(a)) යටතේ දක්වා තිබුණි.	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙන් ඉවත් කර ගනු ලැබුයේ 2025 පෙබරවාරි 20 දින වන අතර එම ගොඩනැගිල්ල කුලියට ගැනීමට අදාළ කැබිනට් පත්‍රයේ අනුමැතිය 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී ඇත. එහිදි ඉතිරි මාස 01 ත් දින 20 ක් සඳහා වන ගෙවීම් සිදු කිරීමට නැවත කැබිනට් මණ්ඩල අනුමැතිය අවශ්‍ය වේ. ආයතනය සඳහා තවදුරටත් ගෙවීමට ඇති වියදම් අඩු කළ පසු ඉතිරි මුදල නැවත ලබා ගත යුතු වේ.	කැබිනට් මණ්ඩල අනුමැතිය අනුව අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

	ඒ සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල සංදේශය මුදල් අමාත්‍යාංශය විසින් සකස් කරමින් පවතින අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද වහාම කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම නිරවුල් කර ගත හැකි වේ.	

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සහ මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුවෙන් වෙන් කර දී තිබුණු එකතුව රු.14,850,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි.	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා ආයෝජන හිතකාමී පරිසරයක් ගොඩනැගීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට සිදුවුවද ප්‍රතිපාදන ඉල්ලීම් ඉදිරිපත් නොවුන බැවින්ද, ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 අනුව ප්‍රාග්ධන වියදම් කළමනාකරණය කිරීම නිසා නව ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම් යනාදිය අවම කිරීම සිදු කළ බැවින්ද මූලධන ප්‍රතිපාදන උපයෝජනය නොවීය.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය.
(ආ)	පුනරාවර්තන වැය විෂයයන් 09 ක් සහ මූලධන වැය විෂයයන් 04 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු.50,350,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන්, උපයෝජනය කර තිබුණේ රු. 6,669,225 ක් එනම් සියයට 13 ක් පමණි.	ප්‍රතිපාදන සැලසී තිබුණද අවශ්‍යතාවය මත වියදම් සිදු කිරීම හා අමාත්‍යාංශයේ කාර්යයන් 2024 සැප්තැම්බර් මාසයේ සිට විධිමත්ව ක්‍රියාත්මක කරගත නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	- එම -

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	- එම -

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම		
මුදල් රෙගුලාසි 756 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 ඡේදය	සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රථම මෙම අමාත්‍යාංශය වසා දැමීමේ කටයුතු සිදුකළ යුතු වූ බැවින් භාණ්ඩ සමීක්ෂණ කාර්යයන් සම්පූර්ණ කරගත නොහැකි විය.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා SWIFT ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය මඟින් රු.10,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර එය 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, 2024 සැප්තැම්බර් 30 දින වන විටත් එහි නිම කිරීම සියයට 50 ක් පමණක් බව නිරීක්ෂණය විය.	මෙම ක්‍රියාකාරකමෙහි වැඩකටයුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉටු කළ අතර අමාත්‍යාංශය මඟින් මෙම වැඩසටහන කඩිනම් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් අවස්ථා කිහිපයකදීම උපදෙස් ලබා දෙන ලදී. නමුත් 2024 දෙසැම්බර් 31 වන විට ක්‍රියාකාරකම අවසන් වී නොතිබුණු අතර වෙන් කළ ප්‍රතිපාදන වියදම් නොවීය.	සැලසුම් කළ කාර්යයන් කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ සහතිකපත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා 10 කට සහ මාර්ගගත හා අන්තර්ජාල තාක්ෂණය පිළිබඳ වැඩමුළු 4 කට සිසුන් 320 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණද පාඨමාලා 2 කට හා එක් වැඩමුළුවකට ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව 92 ක් එනම් සියයට 29 ක් විය. 2019 වර්ෂයේ 336 ක් වූ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 2024 වර්ෂය වන විට 92 ක් දක්වා එනම් සියයට 72 කින් අඩු වී තිබෙන බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ පාඨමාලා 10 ක් සඳහා අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව 350 ක් වුවද පාඨමාලා 2 ක් සඳහා ලියාපදිංචි වී තිබුණු සිසුන්	පිළිතුරු ලබා දී නැත.	තොරතුරු තාක්ෂණ උද්‍යාන වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අමාත්‍යාංශය පූර්ණ අධීක්ෂණයක් සිදු කළ යුතු අතර අවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

	සංඛ්‍යාව 64 ක් විය. තවද රජයේ ප්‍රතිපාදන යටතේ 2024 වර්ෂයට අදාළව පාඨමාලා 2 ක් යටතේ සිසුන් 50 ක් ලියාපදිංචි කර ගැනීමට සැලසුම් කළද කිසිදු සිසුවෙකු ලියාපදිංචි වී නොතිබුණි.		
(ආ)	යාපනය හා මන්නාරම උද්‍යාන දෙකෙන් සමාලෝචිත වර්ෂයේදි අපේක්ෂිත පාඨමාලා ගාස්තු ආදායම පිළිවෙලින් රු.1,129,000 ක් හා රු.2,625,000 ක් වුවද ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව අඩු වීම හේතු කොට ගෙන රාජ්‍ය ආදායමට එකතු කර ගත හැකිව තිබුණේ යාපනය උද්‍යානයෙන් රු.107,220 ක්ද මන්නාරම උද්‍යානයෙන් රු.818,560 ක්ද වශයෙන් විය. මෙම උද්‍යාන නඩත්තුව හා පාඨමාලා පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂයේදී යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා වැය කර තිබුණු පිරිවැය පිළිවෙලින් රු.7,977,856 ක් හා රු.7,318,591 ක් විය. ඒ අනුව උද්‍යාන දෙකෙහි සිසුන් 156 දෙනෙකුගෙන් එකතු කළ ආදායමට වඩා රු.14,370,667 ක් වැඩියෙන් වැය කර තිබුණි.	පිළිතුරු ලබා දී නැත.	- එම -
(ඇ)	මෙම තොරතුරු තාක්ෂණ උද්‍යාන පිහිටුවීමේ අරමුණ වූයේ ප්‍රජාව අතර මූලික පරිගණක දැනුම පුළුල් කිරීම, අඩු පිරිවැයක් යටතේ අන්තර්ජාල පහසුකම් ලබාදීම තුළින් තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය, ප්‍රදේශයේ දිළිඳු පවුල්වල දරුවන්හට පරිගණක පුහුණුව නොමිලේ ලබා දීම වුවද පරිගණක පුහුණුව නොමිලේ ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂයේදී එවැනි සිසුන් තෝරා ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නැත.	- එම -

4.3 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම 2021 සැප්තැම්බර් 29 දින රජයේ සම්පූර්ණ කොටස් හිමි සමාගමක් වශයෙන් සංස්ථාපනය කර, අංක 2289/43 හා 2022 ජූලි 14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබුණ ද 2022 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මකව නොතිබුණු අතර එදින සිට එක් එක් මූල්‍ය වර්ෂයට අදාළව එහි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත විගණිත දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නැත.	මූල්‍ය ප්‍රකාශන පිළියල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ අංක 21/1641/301/020 හා 2021 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමේ ලිපිය අනුව ගාල්ල, කුරුණෑගල, මහනුවර සහ නුවරඑළිය යන ප්‍රදේශවල යෝජනා කරන ලද තාක්ෂණික උද්‍යාන 4 ක් ඉදි කිරීම සඳහා සැලසුම් කර තිබුණද 2025 මාර්තු 25 දින වන විට ගාල්ල සහ කුරුණෑගල තාක්ෂණික උද්‍යානයන්හි පමණක් ඉදි කිරීම් කටයුතු ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම විසින් ආරම්භ කර තිබුණි. කෙසේ නමුත්, 2022 අප්‍රේල් වන විට ආර්ථික අවපාතය හේතුවෙන් එම ඉදිකිරීම් නවතා දැමීමට රජය තීරණය කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් නැවත ඉදි කිරීම ආරම්භ කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවරක් ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.	පිළිතුරු ලබා දී නැත.	ව්‍යාපාතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන ඉදි කිරීම් සඳහා අත්තිකාරම් ගෙවීම වෙනුවෙන් 2021 වර්ෂයේදී මහජන බැංකුවෙන් හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු.750,000,000 බැගින් එකතුව රු.1,500,000,000 ක ණය මුදලක් ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම විසින් ලබා ගෙන තිබුණු අතර එම ණය මුදල් හා ගෙවිය යුතු පොලිය සඳහා මහා භාණ්ඩාගාරය ඇප වන බව ණය ගිවිසුමෙහි දක්වා තිබුණි. ණය මුදල් ගෙවීම සඳහා වර්ෂ දෙකක සහන කාලයක් ලබා දී, මේ වන විට එම සහන කාලය ඉක්ම වී තිබුණද එම ණය වාරික 2024 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම් කර නොතිබුණු අතර මහජන බැංකුවෙන් 2025 අප්‍රේල් 30 දින ලැබුණු ශේෂ සනාථන ලිපිය අනුව එම ණය මුදල මත පොලිය ලෙස රු.477,995,343 ක මුදලක් ද, ප්‍රමාද පොලී ගාස්තු අදාළ අය කිරීම් ලෙස රු.3,590,838 ක මුදලක්ද වශයෙන් බැංකුවට ගෙවිය යුතු මුළු මුදල ලෙස රු.1,231,586,181 ක මුදලක් දක්වා තිබුණි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ණය මුදල් සඳහා ගිවිසුම් ප්‍රකාරව අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු පොලි මුදල සම්බන්ධව ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නැත.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	ඉහත ඉදි කිරීම් කාර්යයන් දෙක වෙනුවෙන් 2022 මැයි 31 දිනට කළ වැඩ සඳහා රු.21,592,870 සහ කොන්ත්‍රාත්තුව අත්හිටුවීමේ කාල පරිච්ඡේදය (එනම් 2022 ජුනි සිට 2023 අප්‍රේල් දක්වා) සඳහා අතිරේක හිමිකම් පෑම සඳහා රු.22,615,000 ක් වශයෙන් මුළු මුදල වූ රු.44,207,870 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ උපදේශකවරයාට ගෙවීමට නියමිතව තිබුණි. ඒ අනුව ඉදි කිරීම් විධිමත්ව සැලසුම් කරමින් හා ප්‍රමාද ගාස්තු ඇති නොවන පරිදි උපදේශකවරයාට ගෙවිය යුතු මුදල නිවැරදිව හඳුනා ගෙන ගෙවීම විධිමත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.	පිළිතුරු ලබා දී නැත.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඉ)	කුරුණෑගල තාක්ෂණික උද්‍යානයේ ඉදි කිරීම් සඳහා ලබාගත් ණය මුදලට අදාළ පොලී හා ප්‍රමාද ගාස්තු හැර තෙවන පාර්ශවයන්ට ගෙවිය යුතු මුළු මුදල රු.5,747,440,968 ක් පමණ වන බව නිරීක්ෂණය විය.	පිළිතුරු ලබා දී නැත.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2014 සැප්තැම්බර් 11 දිනැති අංක 1879/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති සමාගම විසින් යෝජිත ආයෝජනය වූ ඇ.ඩොලර් මිලියන 1,337 ක මුදල වර්ෂ 8 ක් ඇතුළත ආයෝජනය කළ යුතු වුවද එම මුදල ආයෝජනය අදාළ කාල සීමාව තුළ ආයෝජනය කර තිබේදැයි තහවුරු කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අපොහොසත් විය.	ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහනගර සංවර්ධන අමාත්‍යාංශය (Megapolis) නාගරික සංවර්ධන අධිකාරිය හා ව්‍යාපෘති සමාගම අතර අත්සන් කරන ලද ත්‍රෛපාර්ශවීය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක වීම සිදුවේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රමිති තත්ත්වය පිළිබඳ jointly appointed employers' quality representative ලෙස CECB (ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යාංශය) කටයුතු කරනු ලබයි.	ත්‍රෛපාර්ශවීය ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	වරාය නගර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ලබා දුන් අදියර 1 හි ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ තොරතුරුවලට අනුව, ව්‍යාපෘතියේ මාර්ග, පාලම් හා උද්‍යාන අලංකරණ කටයුතු 2024 මාර්තු 31 දින වන විට සියයට 100 ක් අවසන් කළ යුතු වුවද, 2025 ජනවාරි 31 දිනට මාර්ග පද්ධතියේ වැඩ සියයට 74 කුත් මගී පාලම් සියයට 73 කුත් උද්‍යාන අලංකරණ කටයුතු සියයට 77 කුත් පමණක් ඉදිකිරීම් අවසන් කර තිබුණි.	දැනට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සතුව තිබූ කොළඹ වරාය නගරය සම්බන්ධ ලිපිගොනු මුදල් අමාත්‍යාංශය වෙත භාරදී ඇති බැවින් ගොනු පරික්ෂා කිරීමකින් තොරව ව්‍යාපෘති ප්‍රගතිය සම්බන්ධ සංඛ්‍යාත්මක අගයන් පිළිබඳ අදහස් දැක්විය නොහැකි බව දන්වමි. මේ පිළිබඳ යාවත්කාලීන තොරතුරු මුදල් අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීම සුදුසු බව දන්වා ඇත.	ව්‍යාපෘති වාර්තාවෙහි කාල රාමුවට අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	2016 අගෝස්තු 12 දින අත්සන් කරන ලද ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව වරාය නගර සීමාව දක්වා යටිතල පහසුකම් සැපයීම ශ්‍රී ලංකා රජයේ වගකීමක් වන නමුත් එලෙස යටිතල පහසුකම් සපයන නියෝජිතායතන එනම් ලංකා විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන හා	පිළිතුරු ලබා දී නැත.	ත්‍රෛපාර්ශවීය ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	ජලාපවහන මණ්ඩලය සහ කොළඹ නගර සභාව සමඟ 2024 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය විසින් කිසිදු ගිවිසුමකට එළඹී නොතිබුණි.		
(ඈ)	ත්‍රෛපාර්ශ්වීය ගිවිසුමට අනුව අලෙවි කළ හැකි ඉඩම්වලින් ව්‍යාපෘති සමාගමට හෙක්ටයාර් 116 ක් හා ශ්‍රී ලංකා රජයට හෙක්ටයාර් 62 ක් වශයෙන් ඉඩම් වෙන් කර තිබුණු අතර ව්‍යාපෘති සමාගමට අයත් ඉඩම් කොටස් මේ වන විටත් ඉදිකිරීම් (තාවකාලික/ස්ථිර) ආරම්භ කරමින් ආදායම් ඉපයිය හැකි තත්ත්වයකට පත් කර ඇති නමුත් ශ්‍රී ලංකා රජය සතු ඉඩම් කොටස්හි කිසිදු ඉදිකිරීමක් සිදු කර ආදායමක් ලබා ගත හැකි මට්ටමකට පත් කර නොතිබුණු බව 2025 අප්‍රේල් 22 දින සිදු කළ කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	පිළිතුරු ලබා දී නැත.	සංවර්ධනය කරන ලද ඉඩම් ආයෝජකයින් හට ලබාදී ආදායම් ඉපයිය හැකි තත්ත්වයකට පත් කිරීමට කඩිනම් පියවර ගත යුතුයි.
(ඉ)	කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ අපජලය කළමනාකරණය සඳහා ස්ථිර විසඳුමක් සපයන තුරු තාවකාලික විසඳුමක අවශ්‍යතාවය කොළඹ නගර සභාව විසින් දන්වා තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට ඊට අදාළ ඉදි කිරීම් කොන්ත්‍රාත්තු තුනක් වෙනුවෙන් රු.861,238,973 ක වියදමක් දරා තිබුණි. එම තාවකාලික විසඳුමෙහි වැඩ කටයුතු තවදුරටත් අවසන් වීමට නියමිතව තිබෙන නමුත් රු.2,900,000,000 ක මුළු පිරිවැයකට ඇස්තමේන්තු ගත කර 2022 වර්ෂය අවසානයේදී සම්පූර්ණ කළ යුතු ස්ථිර විසඳුම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට දරන ලද වියදම රු.27,600,486 ක් වූ අතර මේ වන විට එහි වැඩ අත්හිටුවා තිබුණි. මේ අනුව නිසි සැලසුම්කරණයකින් හා ගෙවීම් කළමනාකරණයකින් තොරව ඉදි කිරීම් ව්‍යාපෘති සිදු කිරීම තුළ අපේක්ෂිත නිසි ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකිවීමෙන් අමාත්‍යාංශය විසින් අපජලය කළමනාකරණ ස්ථිර විසඳුම සඳහා දරන ලද රු.27,600,486 ක් වූ වියදම, නිෂ්කාර්ය වී ඇති බව නිරීක්ෂණය විය.	කොළඹ වරාය නගරය ව්‍යාපෘතියේ අපජලය කළමනාකරණය සඳහා සැපයීම කොළඹ වරාය නගරය සම්බන්ධ ත්‍රෛපාර්ශවීය ගිවිසුම අනුව ශ්‍රී ලංකා රජයේ වගකීමකි. ඒ අනුව දැනට ක්‍රියාත්මකව පවතින කොළඹ නගරයේ අපජල පරිවහනයට යොදා ගන්නා දකුණු ජල මාර්ග පද්ධතියේ නවීකරණයක් පමණක් මෙම ව්‍යාපෘතිය හරහා සිදුවේ. එම නවීකරණයන් 2024 අවසන් කාර්තුව වන විට නිම කිරීමට ආසන්නව පැවතුණි. උතුරු ජල මාර්ග පද්ධතිය ඉදිකිරීම කොළඹ වරාය නගරය සම්පූර්ණ කළ විට එයින් ඉවතට යොමු කෙරෙන අපජලය ප්‍රවාහනය සඳහා එයට වෙන්වූ පහසුකමක් ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ වුවද පසුව රජයේ තීරණ වලට අනුකූලව තාවකාලිකව නවතා තිබුණි. නමුත් එසේ තාවකාලිකව නතර කරන තෙක් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කරුවන් ලෙස ක්‍රියාකළ පෞද්ගලික ආයතන විසින් කරන	නිසි සැලසුම්කරණයකින් යුතුව අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත හැකි ආකාරයට ව්‍යාපෘති වියදම් කළමනාකරණය කළ යුතුය.

	ලද ඉදිකිරීම් සඳහා මුදල් ගෙවීම කළයුතුව තිබුණි. ඒ අනුව ජාතික මෙහෙයුම් මැදිරියට මෙම කරුණු ඉදිරිපත් කොට එහිදී ලබාදුන් තීරණයක් අනුව ගෙවීම් කරන ලදී. මෙම ගෙවීම් සම්බන්ධ සවිස්තරාත්මක කරුණු අදාළ ගොනු වලින් ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් විමසීම සුදුසු බව දන්වා ඇත.	

4.5 වාර්ෂික කාර්යයසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව 2024 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව අමාත්‍යාංශයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2025 අගෝස්තු 30 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නැත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.